**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව -2010**

------------------------------------------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්</u>**

1.2.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු හා රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදලේ ප්‍රති ආයෝජනය කර තිබුණු රු.92,171,801 ක් වූ ලාභාංශ වර්ෂ අවසානයට ගිණුම් වලට ගෙන නොතිබුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල සෙස් අරමුදල යටතේ දක්වා තිබුණු රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදලේ ආයෝජන අගය වූ රු.360,255,392 ක මුදල, රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදලේ කළමනාකරු විසින් තහවුරු කරන ලද රු.452,427,199 ක මුදල සමඟ එකඟ නොවීය. සිරිතක් වශයෙන් කොමිෂන් සභාව විසින් වර්ෂය තුළදී ලැබූ ලාභාංශ වර්ෂය අවසානයට ලැබිය යුතු දෑ ලෙස දක්වා පසු වර්ෂයේදී ආයෝජන වටිනාකමට ගලපනු ලැබේ.

1.2.2 **<u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>**

සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පිරික්සුමේ දක්වා තිබුණු කොමිෂන් සභාවේ බැංකු ගිණුම් තුනක් සම්බන්ධයෙන් වූ එකතුව රු.23,642,191 ක් වූ ශේෂයන් සාවද්‍ය ලෙස රු.23,435,131 ක් වශයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශනයට ගෙන තිබුණි. ඒ අනුව, එම බැංකු ගිණුම් සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනවල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

1.2.3 **<u>නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>**

2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 30 දරන එම්එස්ඩී චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2009 ජූලි 08 දිනැති පීඊඩී/පීඊ චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 06/2006 චක්‍රලේඛයේ

දක්වා තිබුණු වැටුප් හා උසස් කිරීමේ පරිපාටියට සමගාමී වන පරිදි සියලුම රාජ්‍ය ව්‍යාපාර, ඔවුන්ගේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ ක්‍රියාපරිපාටිය පිළියෙල කළ යුතුය. තවද, 2009 ජූලි 08 දිනැති පීඒඩී/පීඊ චක්‍රලේඛ ලිපිය මගින් 2009 ජූලි 30 දිනට පෙර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට හැකිවන පරිදි තම බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය සම්පූර්ණ කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වෙතත්, 2011 අප්‍රේල් 30 දින වන තෙක් වැටුප් හා සේවක සංඛ්‍යා තත්ත්වය ප්‍රතිව්‍යුහගත කිරීමේ ජාතික ප්‍රතිපත්තියට අනුගත වන පරිදි කොමිෂන් සභාව විසින් අදාල පියවර ගෙන නොතිබුණු අතර සභාපතිනිය, කොමිෂන් සභාව වැනි ආයතන සඳහා විශේෂ නියාමක ව්‍යුහයක් සකස් කිරීමට පහසුවන පරිදි වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත නියෝජනයන් ඉදිරිපත් කරන බවට අදහස් දක්වා තිබුණි.

1.2.4 <u>විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් සහභාගීවන්නන් විසින් ගෙවන ලද පාඨමාලා ගාස්තු පිළිබඳ විස්තර මූල්‍ය සේවා විද්‍යායතනයේ හෝ කොමිෂන් සභාවේ මුදල් අංශයේ හෝ නොවීම හේතුවෙන් මල්‍ය සේවා විද්‍යායතනය උපයා තිබුණු රු.14,139,970 ක් වූ සම්මන්ත්‍රණ ආදායම විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. එක් එක් පාඨමාලාව මගින් උපයන ලද ආදායම පිළිබඳ විස්තර ඉල්ලා තිබුණු නමුත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2010 අප්‍රේල් 19 දින පැවති රැස්වීමේදී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි කුලියට ලබාගත් වාහනයක් පාවිච්චි කිරීමේ පහසුකම ලබා නොගන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන් හා සහකාර අධ්‍යක්ෂවරුන්ට ලබාගත හැකි වාහන දීමනාව පිළිවෙලින් රු.89,000 , රු.65,000 හා රු.35,000 වශයෙන් වැඩිකර තිබුණි. කෙසේ වෙතත්, වාහන දීමනාව වැඩි කිරීමට සම්බන්ධ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2. **<u>මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය සමාලෝචනය</u>**

**<u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර ඉකුත් වර්ෂයේ අනුරූපී ශුද්ධ ඌනතාවය වූ රු.174,908,861 සමග සසඳන විට 2010 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මෙහෙයුම් වල ප්‍රතිඵලය රු.191,084,798 ක ශුද්ධ ඌනතාවයක් වීමෙන් පෙනී යන්නේ ශුද්ධ ඌනතාවය රු.16,175,937 කින් ඉහළ යාමක් සිදුවී තිබුණු බවය. සෙස් අරමුදලින් මාරු කිරීම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ඉකුත් වර්ෂයේ අනුරූපී ශුද්ධ අතිරික්තය වූ රු.1,593,557 සමග සමාලෝචිත වර්ෂයේ සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව වූ ශුද්ධ අතිරික්තය වූ රු.4,694,399 සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,100,842 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2.2 **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

2.2.1 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ අවසානයේ සේවයේ යෙදී සිටි නිලධාරීන් 72 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන් 70 දෙනෙකුගෙන් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සමන්විත වූ බව නිරීක්ෂණය විය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වැඩ ආවරණය කර තිබුණු අධ්‍යක්ෂ, නීති හා බලගැන්වීම් තනතුර වර්ෂ දෙකක කාලයක් පුරා හිස්ව පැවතුණි. ඊට අමතරව, 2010 ජූලි මාසය වන තෙක් අධ්‍යක්ෂ, මානව සම්පත් තනතුර සඳහා කොමිෂන් සභාව පුද්ගලයෙකු කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණු අතර පසුව අධ්‍යක්ෂ, මුදල් හා පරිපාලන වෙත අදාල වගකීම් පවරමින් එම තනතුර අහෝසි කර තිබුණි. තවද, 2006-2015 කාලය සඳහා කොමිෂන් සභාවේ ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට 2007 වර්ෂයේදී ඇති කර තිබුණු අධ්‍යක්ෂ, බාහිර සම්බන්ධතා සහ වෙළඳපල සංවර්ධන තනතුර, 2010 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන සැලැස්ම සම්පූර්ණ කර නොතිබියදීත් අහෝසි කර තිබුණි. තවද, කළමනාකරු තනතුරු දෙකක් වර්ෂ තුනකට වඩා කාලයක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) 1992 මාර්තු 31 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ ලේකම්වරයාගේ ලිපිය අනුව අනෙකුත් රජයේ රෙගලාසි නොසලකා සිය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා ඔවුන්ගේ වැටුප් හා වෙනත් පාරිතෝෂික දීමනා තීරණය කිරීමට

කොමිෂන් සභාව වරප්‍රසාද ලබා ඇත. කොමිෂන් සභාව කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය පදනම් කර ගෙන 2010 අප්‍රේල් හා දෙසැම්බර් මාස වලදී රු.6,064,446 ක් වූ වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කර තිබුණි. තවද, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරුන් කල ඉල්ලීමක් මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වෙත රු.3,269,349 ක පාරිතෝෂික දීමනාවක්ද 2010 දෙසැම්බර් මස ලබාදී තිබුණි.

2.2.2 <u>සංයුක්ත සැලැස්මේ නියම කරන ලද ඉලක්ක සපුරා ගැනීමේ අඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන් කරන ලැබේ.

(අ) <u>සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධ නීති සංශෝධන</u>

කොමිෂන් සභාවේ 2010 සිට 2012 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම අනුව, විචක්ෂණ ආකාරයෙන් කොටස් වෙළඳපල කටයුතු අධීක්ෂණය කිරීමට කොමිෂන් සභාවට හැකිවන පරිදි කොමිෂන් සභාවේ කටයුතු සම්බනධ නීති සංශෝධනය කිරීමට බලාපොරොත්තු විය. මේ සම්බන්ධ මූලික කටයුතු 2009 පලමු කාර්තුව තුළ ආරම්භ කර තිබුණු නමුත් 2010 දෙසැම්බර් 31 දින වන විට පෙන්වා තිබුණේ සතුටුදායක නොවන ප්‍රගතියකි. විස්තර පහත දැක්වේ.

(i) කොළඹ කොටස් වෙළඳපල නිර්-සංගතකරණය සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට කෙටුම්පත් පත්‍රිකාවක් 2010 මාර්තු මාසයේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය වෙත සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට කොටස් හිමිකම් ව්‍යුහය සහ පාලන ව්‍යුහය සම්බන්ධයෙන් වන කරුණු කොළඹ කොටස් වෙළඳපල සමඟ සාකච්ඡා කරමින් පැවතුණි.

(ii) ඊට අමතරව, සමාගම් අත්පත් කර ගැනීම හා ඒකාබද්ධවීම පිළිබඳ නීති සංග්‍රහය සංශෝධනය කිරීමට හැකි වන පරිදි සහ දේශීය වශයෙන් හා ජාත්‍යන්තරව ප්‍රාග්ධන වෙළඳපල වල මෑත කාලීන සංවර්ධනයන් සමඟ ගැලපෙන පරිදි අදාල නීත සංග්‍රහය සැකසීම පිළිබඳ යෝජනාවන් 2009 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මට ඇතුලත් කර තිබුණි. කොමිෂන් සභාව විසින් සිදුකර තිබුණු පැහැදිලි කිරීම අනුව, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ

ගරු විනිශ්චයකාරවරයෙකුගේ මගපෙන්වීම ලබා ගැනීම සහ මෙරට හා වෙනත් රටවල පවත්නා අත්පත් කර ගැනීම් හා ඒකාබද්ධවීම් සම්බන්ධ නීති පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණ හා සමාලෝචනයන් සිදු කිරීම වැනි පියවරයන් කිහිපයක් ගෙන තිබුණි. මේ සඳහා 2009 හා 2010 වර්ෂ වලදී උපදේශක ගාස්තු වශයෙන් රු.1,140,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගෙන තිබුණු පියවර ප්‍රාථමික මට්ටමක පැවතුණි.

(iii) තවද, 2010-2012 සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර තිබුණු සුරැකුම්පත් මගින් ගනුදෙනුවන අරමුදල් සඳහා රීතීන් හඳුන්වාදීමට ඒකක භාර අරමුදල් නීති සංග්‍රහය සංශෝධනය කිරීම, මධ්‍යම ප්‍රතිපාර්ශවයක් හා ශ්‍රී ලංකා ආයෝජන සංගමයක් පිහිටුවීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතට විධිවිධාන ඇතුළත් කිරීම යනාදී පියවරයන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් දුර්වල ප්‍රගතියක් පෙන්වා තිබුණි. සභාපතිනිය මා වෙත දන්වා තිබුණේ සුරැකුම්පත් මගින් ගනුදෙනුවන අරමුදල් සඳහා නිම කරන ලද රීතීන්, ඒකක භාර අරමුදල් කාර්ය සංග්‍රහයට ඇතුළත් කර ගැසට් නිවේදන නිකුත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබෙන බවය. ආයෝජන සංගමයක් පිහිටුවීම පිළිබඳ යෝජනාව 2010 වර්ෂයේදී කල්දමා තිබුණු අතර 2011 වර්ෂය සඳහා වූ සංයුක්ත සැලැස්මට ඇතුළත් කිරීම සඳහා අනුමැතිය ලැබී තිබුණි.

(ආ) <u>කොමිෂන් සභාවේ අනෙකුත් පද්ධති සංවර්ධනය</u>

කොමිෂන් සභාවේ අභ්‍යන්තර පද්ධතීන් සංවර්ධනයට 2009 වර්ෂයේ සිට සංයුක්ත සැලසුම්වල ඇතුළත් වූ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාවේ මුදල් හා පරිපාලන/ මානව සම්පත් කළමනාකරණ අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ ගෙන තිබුණු පියවර සතුටුදායක ප්‍රගතියක් පෙන්වා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) කොමිෂන් සභාවේ පරිපාලන අත්පොත සංවර්ධනය කිරීමේ කටයුතු, 2009 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට අත්පොතෙහි පළමු කෙටුම්පත පමණක් නිකුත් කිරීමට හැකිවී තිබුණි.

(ii) 2009 වර්ෂයේ සිට සංයුක්ත සැලැසුම් වල ඇතුලත් වූ මානව සම්පත් තොරතුරු පද්ධතියක් හඳුන්වා දීමට සඳහා වූ යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට එළදායී පියවර ගෙන නොතිබුණි.

(iii) 2009 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මවල ඇතුලත් වූ අත්දැකීම් හුවමාරුව සඳහා වූ අභ්‍යන්තර පීඨයක් සංවර්ධනය කිරීම, සංවිධානමය සංවර්ධන සැලැස්මක් සකස් කිරීම, සේවක තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණයක් කිරීම යනාදි කටයුතු තවදුරටත් කල්දමා තිබුණ.

### 2.2.3 <u>කොමිෂන් සභාවේ සාමාජික රැස්වීම් වලදී එළඹී තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 මැයි 22 දින පැවැත්වූ කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණය පරිදි කොමිෂන් සභාවේ වෙළඳපල ආවේක්ෂණ කටයුතු ස්වයංක්‍රියකරණය සඳහා පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීමට ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය මගින් තෝරාගත් සැපයුම්කරුවෙකුට රු.7,213,638 ක් වූ අත්තිකාරම් මුදලක්, කොමිෂන් සභාව 2009 දෙසැම්බර් 30 දින ගෙවා තිබුණි. තෝරාගත් සැපයුම්කරු සමඟ කොමිෂන් සභාව එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව 2010 වර්ෂය මැද භාගය වන විට පද්ධතියේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, 2011 මැයි 31 දින වන විටත් එම පද්ධතිය ක්‍රියාත්මකව නොපැවතුණි. තවද, කොමිෂන් සභාව 2010 සැප්තැම්බර් මාසයේදී වෙළඳපල ආවේක්ෂණ පද්ධතිය පිළිබඳව පරිශීලක පිළිගැනුම් පරීක්ෂණයක් සිදු කිරීම සඳහා තොරතුරු පද්ධති විශේෂඥවරයෙකු පත් කිරීමට පියවර ගෙන තිබුණි. 2011 මාර්තු 14 දිනැති විශේෂඥවරයාගේ වාර්තාව පරිදි දෘඩාංග පද්ධතිය පිහිටුවීම, දත්ත ගබඩා පද්ධතිය, සීමාවන්, කාර්ය මණ්ඩල පුහුණුව වැනි ක්ෂේත්‍ර ඇතැම් දුර්වලතාවයන් පෙන්වා දී තිබුණි. මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සභාපතිනිය, අදාල පද්ධතිය දැනට ක්‍රියාත්මකව පවතින බවත්, පද්ධතිය වැඩි දියුණු කිරීම සම්පූර්ණ වනතෙක් පැරණි සහ නව පද්ධතීන් සමගාමීව ක්‍රියාත්මක වන බවත් සඳහන් කර තිබුණි.

(ආ) 2010 මාර්තු 24 දින පැවැත්වුණු රැස්වීමේදී කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළඳපලට පිවිසීම පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධව සමීක්ෂණයක් සිදුකිරීමත් එහි ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක් 2010 ඔක්තෝබර් මාසය වන විට ප්‍රසිද්ධ කිරීමටත් තීරණය කර තිබුණි. මෙම සමීක්ෂණය විශ්ව විද්‍යාල හතකින් තෝරාගත් උපාධි අපේක්ෂකයින් 51 දෙනෙකු

මඟින් සිදු කිරීමට රු.1,003,000 ක මුදලක් කොමිෂන් සභාව වැයකර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2011 අප්‍රේල් 30 වන විටත් සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රසිද්ධ කර නොතිබුණි.

### 2.2.4 <u>මතභේදයට තුඩුදෙන කරුණු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා 2008 ජූලි 06 දින සිට සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු මත ඇමෙරිකා එක්සත් ජනපදයේ දී ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක් හැදෑරීම වෙනුවෙන් වර්ෂ හතරක අනිවාර්ය කාල සීමාවක් සේවය කිරීමට කොමිෂන් සභාව සමඟ ගිවිසුමකට 2007 ජූලි 05 දින එළඹ තිබුණි. ගිවිසුමේ 07 වැනි ඡේදය ප්‍රකාර, අනිවාර්ය සේවා කාලයට පෙර ඉල්ලා අස්වීමකදී සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් දරන ලද මුළු මුදල හෝ කොමිෂන් සභාව තීරණය කරන මුදලක් ආපසු ගෙවීමට අදාල නිලධාරියා බැඳී සිටී. ලබාගත් තොරතුරු අනුව, නිලධාරියාගේ විදේශ අධ්‍යාපන කාල සීමාව තුළ කොමිෂන් සභාව රු.3,024,168 ක මුදලක් දරා තිබුණි. කෙසේ වෙතත්, රු.61,500 ක් පමණක් අය කිරීමටත් 2012 ජූලි 06 දිනෙන් පසු අනිවාර්ය සේවා කාලයෙන් නිලධාරියා මුදා හැරීමටත් කොමිෂන් සභාව තීරණය කර තිබුණි.

(ii) ගිවිසුමේ 03 වැනි ඡේදයේ වූ විධිවිධාන පරිදි පුහුණු පාඨමාලාව සඳහා කිසිදු මූල්‍ය අනුග්‍රහයක් සිදු කිරීමට කොමිෂන් සභාව බැඳී නොසිටි නමුත් 2007 ජූලි මාසයේදී දරා තිබුණු පාඨමාලා ගාස්තුව ප්‍රතිපූර්ණය කිරීමක් වශයෙන් 2010 පෙබරවාරි 01 දින එම නිලධාරියාට රු.250,000 ක මුදලක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) 2010 අප්‍රේල් 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාල වගකීම් හා කාර්ය භාරයන්ගෙන් එම නිලධාරියා නිදහස් කර තිබුණු නමුත් 2010 මැයි සහ ජූනි මාස සඳහා රු.89,411 ක වාහන දීමනාවක්ද එම නිලධාරියාට ගෙවා තිබුණි.

(ආ) 2002 ජූනි 04 හා 2009 ඔක්තෝබර් 28 දින පැවති කොමිෂන් සභා සාමාජික මණ්ඩල රැස්වීම් වලදී එළඹෙන ලද තීරණ ප්‍රකාරව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂවරුන්ට රු. මිලියන 2.5 ක උපරිම වටිනාකමක් මත වාහන සඳහා කල් බදු පහසුකම් සැලසීමටත්, කල් බදු කාලසීමාව අවසානයේදී වාහනය අත්පත් කර ගැනීමේ කැමැත්ත තීරණය කිරීමට ඉඩ දීමටත්

අවස්ථාව සලසා තිබුණි. රාජ්‍ය අංශයේ වෙනත් ආයතන විසින් මීට සමාන ආකාරයේ පහසුකම් සලසා නොතිබුණු අතර එම නිසා පෙර වර්ෂ සඳහා විගණන වාර්තාවල මේ පිළිබඳ නිරීක්ෂණයන් දක්වා ඇත. පෙර වර්ෂ වල විගණන වාර්තා වල පෙන්වා දී තිබුණු කරුණු හා නිවැරදි කිරීමට පියවර නොගත් අඩුපාඩු පහත දැක්වේ.

(i) කොම්පැනි සභාවේ සාමාජික මණ්ඩලය ගත් තීරණ මත පමණක් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණු අතර පහසුකම සම්බන්ධ කොන්දේසි අදාල සේවකයින්ට නිකුත් කර තිබුණු පත්වීම් ලිපිවල ඇතුලත් කර තිබුණි. යෝජනා ක්‍රමය සඳහා වෙනම රීති මාලාවක් නිශ්චය කර නොතිබුණි.

(ii) යෝජනා ක්‍රමය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(iii) කල් බදු කාල සීමාව අවසාන වන විට හෝ කල් බදු කාල සීමාව තුළ හිඟ කල් බදු වාරික ගෙවීමෙන් හෝ වාහනයේ හිමිකාරත්වය පවරා ගැනීමේ පහසුකම සේවකයින්ට ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පහසුකම සඳහා හිමිකම ලැබීමේ අවස්ථාවන් ප්‍රමාණය පිළිබඳ සීමාවන් තීරණය කර නොතිබුණි.

තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාහන ලියාපදිංචි කිරීමේ වාර්තා අනුව, එම කල් බදු වාහන කොම්පැනි සභාවේ නමින් ලියාපදිංචි කර තිබුණි. කෙසේ වෙතත්, කල් බදු කාල සීමාව අවසානයේදී හෝ ඕනෑම අවස්ථාවක කල් බදු වාරික නිරවුල් කිරීමෙන් වාහනයේ හිමිකාරත්වය බාහිර පාර්ශවයන්ට පවරා දෙන ලෙස කොම්පැනි සභාව වෙත ඉල්ලීම් කිරීමට අදාල නිලධාරීන්ට ඉඩදී තිබුණි. ඒ අකාරයට කොම්පැනි සභාවට කිසිදු මූල්‍යමය වාසියක් නොමැතිව 2005 වර්ෂයේ සිට වාහන පහක් බාහිර පාර්ශවයන් වෙත මාරු කර තිබුණි.

(ii) කොම්පැනි සභාව විසින් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා සිටි අධ්‍යක්ෂවරයෙක් 2008 ජූනි සිට මෙම පහසුකම භුක්ති විඳින බව නිරීක්ෂණය විය.

(iii) 2010 සැප්තැම්බර් 17 දින පැවැත්වුණු සිය රැස්වීමේදී රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වාහන කල්බදු පහසුකම පිළිබඳ වෙනම වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවට නියෝග කර තිබුණි. කෙසේ වෙතත්, වෙනම වාර්තාවක් ඉදිරිපත් කිරීමට පියවර ගැනීම වෙනුවට රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නියෝග සම්බන්ධයෙන් ගෙන තිබුණු නිවැරදි කිරීමේ පියවරයන් පිළිබඳ කොමිෂන් සභාව විසින් 2010 දෙසැම්බර් 31 දින රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කළ වාර්තාවේ මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අදහස් ඇතුළත් කර තිබුණි.

### 2.2.5 <u>අයවැය ලේඛනමය පාලනය</u>

ගොඩනැගිලි, ආවේක්ෂණ පද්ධතිය සඳහා උපකරණ ප්‍රසම්පාදනය, කාර්යාල ස්වයංක්‍රියකරණය සහ මෝටර් වාහන අත්කර ගැනීමට පියවර ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොමිෂන් සභාව 2010 වර්ෂය සඳහා ප්‍රාග්ධන අයවැය ලේඛනය යටතේ ප්‍රතිපාදනය කර තිබුණු රු.මිලියන 497 ක මුදලින් රු.මිලියන 33 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. ඊට අමතරව, පුනරාවර්තන අයවැය ලේඛනය යටතේ සේවක මණ්ඩල, ආයතන, වෘත්තීය සංවර්ධනය සහ ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන කටයුතු පිරිවැය සඳහා වෙන් කර තිබුණු රු.මිලියන 287 ක් අතුරින් උපකරණ නඩත්තු පිරිවැය, රක්ෂණ, විදුලිය, විනෝද කටයුතු හා දේශීය පුහුණු කටයුතු ආදී වියදම් සඳහා අධි වෙන්කිරීමක් සිදු කිරීම හා ප්‍රාග්ධන වෙළඳ පල සංවර්ධන කටයුතු අඩු ප්‍රමාණයක් සිදු කිරීම හේතුවෙන් රු.මිලියන 220 ක් පමණක් වැය කර තිබුණි. ඉන් පෙනී යන්නේ අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බවය.

## 3. <u>පද්ධති හා පාලන</u>

1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2011 මැයි 31 දින සභාපතිනිය වෙත ඉදිරිපත් කරන ලදී. කල්බදු වාහන පහසුකම් ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පරිපාලන ක්‍රියාපරිපාටියක් ස්ථාපිත කිරීම , කාර්ය මණ්ඩලයේ උසස් අධ්‍යාපනය සඳහා මූල්‍ය පහසුකම් හා සුභසාධන පහසුකම් සැලසීම, සෙස් බදු එකතු කිරීමෙන් ලැබූ ආදායමේ නිරවද්‍යතාවය තහවුරු කිරීම සහ කොමිෂන් සභාවේ මූල්‍ය සේවා විද්‍යායතනය විසින් මෙහෙයවනු ලබන පාඨමාලාවන් යන කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.